# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
# ஆளுநர் செயலகம் - தென் மாகாணம்
# Governor's Secretariat - Southern Province

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Number: G/SP/1/1/2/2023 | ඔබේ අංකය / உமது இல. / Your Number: | දිනය / திகதி / Date: 2023.12.14 |

18 DEC 2023

D/F

ප්‍රධාන ලේකම්
දකුණු පළාත

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාල කර ගැනීමට අනුමැතිය ලබා ගැනීම (රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් 2024 වසර)**

ශීර්ෂගත කරුණ සම්බන්ධයෙන් මා වෙත යොමු කරන ලද ඔබගේ අංක CSS/7/13/1 හා 2023.12.13 දිනැති ලිපිය දහා බැදේ.

02. ඒ අනුව, 22/2023 අංක දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය, 2021.03.01 දින සිට ක්‍රියාත්මක වන දකුණු පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයේ රීති 562 ප්‍රකාරව 2023.12.07 දින සිට බලාත්මක වන පරිදි දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා 2023.12.14 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වා එවමි.

ඩී.ජී.දීප්ත දයානන්ද
පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් වෙනුවට
දකුණු පළාත

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/2023

මගේ අංකය : EST-6/04/LON/0207
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2023.12.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2024 වසර

2015.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2015 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයේ 03 ඡේදයේ "2015 වර්ෂය" යන්න වෙනුවට "2023 වර්ෂය" යන්න ආදේශ කිරීමට සහ චක්‍රලේඛයේ "2016 වර්ෂය" ලෙස සඳහන්ව ඇති සෑම ස්ථානයකටම "2024 වර්ෂය" යන්න ආදේශ කිරීමට යටත්ව එකී චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව 2024 වර්ෂයට රු.4,000/-කට නොවැඩි වන විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවීමට රජය තීරණය කර ඇත.

03. මෙම අත්තිකාරම් ගෙවීම 2024.01.01 දිනෙන් ආරම්භ කර 2024.02.29 දිනෙන් අවසන් කළ යුතු වන අතර, 2024.02.29 දිනට පසු මෙම අත්තිකාරම් ගෙවීම නොකළ යුතු ය. මෙම අත්තිකාරම් මුදල 2024 වර්ෂය තුළදී ම අයකර අවසන් කළ යුතු ය.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-699399
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk

මෙම රාජ්‍ය පරිපාලන/රාජ්‍ය....................../
......22/2023..............................චක්‍රලේඛය / උපදෙස්
ලිපිය ..2023.12.07.......... දින සිට
දකුණු පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා
ගරු ආණ්ඩුකාරතුමින්ගේ අනුමැතිය..2023.12.14...
දින ලබා දී ඇති බව සහතික කරමි.
..............................................
ආණ්ඩුකාර ලේකම් / සහකාර ලේකම් / පරිනි.

ඩී.පී.දීප්ත දයානන්ද
පරිපාලන නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත